# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.08.23 |


## ජා.පා.මි.ද. මත පදනම් වූ උද්ධමනය 2021 ජූලි මාසයේ දී ඉහළ යන ලදී

**මතුපිට උද්ධමනය**
- වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 6.8%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 5.4%
- මාසික වෙනස : 0.63%

**මූලික උද්ධමනය**
- වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 4.4%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.4%
- මාසික වෙනස : 0.7%

**ජා.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනසෙහි විචලනය**




**ජා.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2021 ජූනි මාසයේ පැවති සියයට 6.1හි සිට 2021 ජූලි මාසයේ දී සියයට 6.8 දක්වා ඉහළ ගියේය. ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම් මේ සඳහා හේතු විය. තවද, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 ජූනි මාසයේ දී පැවති සියයට 9.8හි සිට 2021 ජූලි මාසයේ දී සියයට 11.0 දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 ජූනි මාසයේ පැවති සියයට 2.9හි සිට 2021 ජූලි මාසයේ දී සියයට 3.2 දක්වා ඉහළ ගියේය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි. දර්ශකයෙහි වෙනස, 2021 ජූලි මාසයේ දී සියයට 5.4හි නොවෙනස්ව පැවතුණි.

2021 ජූලි මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස 0.63ක් ලෙස වාර්තා වූ අතර, ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම් මේ සඳහා හේතු විය. තවද, ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල මාසික වෙනස්වීම් පිළිවෙළින්, සියයට 0.37ක් සහ සියයට 0.27ක් ලෙස වාර්තා විය. ඒ අනුව, 2021 ජූලි මාසයේ දී ආහාර කාණ්ඩයේ, ප්‍රධාන වශයෙන්, සීනි, එළවළු, කරවල සහ නැවුම් මත්ස්‍ය මිල ගණන් ඉහළ ගිය අතර, පොල් සහ පොල්තෙල් මිල ගණන්හි පහළ යෑමක් වාර්තා විය. එමෙන්ම, ප්‍රධාන වශයෙන් ප්‍රවාහන (පෙට්‍රල් සහ ඩීසල්) සහ ආපනශාලා සහ හෝටල් යන උප කාණ්ඩවල මිල ගණන්හි සිදුවූ ඉහළ යෑම් හේතුවෙන්, ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි ඉහළ යෑමක් 2021 ජූලි මාසයේ දී වාර්තා විය.

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය 2021 ජූනි මාසයේ දී පැවති සියයට 4.1හි සිට 2021 ජූලි මාසයේ දී සියයට 4.4 දක්වා ඉහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2021 ජූලි මාසයේ දී සියයට 4.4හි නොවෙනස්ව පැවතුණි.

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

## දත්ත ඇමුණුම

### සංඛ්‍යා සටහන 1 : ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2019 | ජනවාරි | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 | 1.8 | 2.7 |
| | පෙබරවාරි | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 | 1.7 | 3.0 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 | 1.7 | 3.3 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 | 1.9 | 3.7 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 | 2.0 | 4.0 |
| | ජූනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 | 2.0 | 4.4 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 | 1.9 | 4.7 |
| | අගෝස්තු | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 | 2.0 | 5.0 |
| | සැප්තැම්බර් | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 | 2.3 | 5.2 |
| | ඔක්තෝබර් | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 | 2.8 | 5.4 |
| | නොවැම්බර් | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 | 3.0 | 5.6 |
| | දෙසැම්බර් | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 | 3.5 | 5.7 |
| 2020 | ජනවාරි | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 | 4.1 | 5.6 |
| | පෙබරවාරි | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 | 4.5 | 5.5 |
| | මාර්තු | 135.2 | 136.0 | -1.3 | 0.1 | 7.0 | 3.2 | 4.9 | 5.2 |
| | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 | 5.1 | 5.0 |
| | මැයි | 135.4 | 137.9 | 0.4 | 0.7 | 5.2 | 3.7 | 5.2 | 4.8 |
| | ජූනි | 137.3 | 138.9 | 1.4 | 0.7 | 6.3 | 4.4 | 5.6 | 4.6 |
| | ජූලි | 137.3 | 139.4 | 0.0 | 0.4 | 6.1 | 4.5 | 5.9 | 4.5 |
| | අගෝස්තු | 137.8 | 139.9 | 0.4 | 0.4 | 6.2 | 4.6 | 6.1 | 4.4 |
| | සැප්තැම්බර් | 138.9 | 140.4 | 0.8 | 0.4 | 6.4 | 4.8 | 6.2 | 4.3 |
| | ඔක්තෝබර් | 139.1 | 140.5 | 0.1 | 0.1 | 5.5 | 4.5 | 6.2 | 4.2 |
| | නොවැම්බර් | 139.8 | 140.6 | 0.5 | 0.1 | 5.2 | 4.5 | 6.3 | 4.2 |
| | දෙසැම්බර් | 141.2 | 140.5 | 1.0 | -0.1 | 4.6 | 4.7 | 6.2 | 4.1 |
| 2021 | ජනවාරි | 142.1 | 141.0 | 0.6 | 0.4 | 3.7 | 4.2 | 5.8 | 4.2 |
| | පෙබරවාරි | 142.8 | 141.3 | 0.5 | 0.2 | 4.2 | 4.1 | 5.5 | 4.2 |
| | මාර්තු | 142.1 | 141.8 | -0.5 | 0.4 | 5.1 | 4.3 | 5.3 | 4.3 |
| | අප්‍රේල් | 142.2 | 142.5 | 0.1 | 0.5 | 5.5 | 4.1 | 5.3 | 4.4 |
| | මැයි | 143.6 | 143.7 | 1.0 | 0.8 | 6.1 | 4.2 | 5.4 | 4.4 |
| | ජූනි | 145.7 | 144.6 | 1.5 | 0.6 | 6.1 | 4.1 | 5.4 | 4.4 |
| | ජූලි | 146.6 | 145.6 | 0.6 | 0.7 | 6.8 | 4.4 | 5.4 | 4.4 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව